# සේවාන්ත ප්‍රතිලාභ නිදහස් කිරීම සඳහා උපදෙස්

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සිදුකිරීමට නියමිත විධිමත් සංශෝධනයන්ට (2021.03.18 වන දින දේශීය ආදායම් පනතට කෙටුම්පත මගින් ගැසට් කර ඇති පරිදි) යටත්ව සහ 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2020 ජනවාරි 31 වන දින මුදල් අමාත්‍යාංශය විසින් දෙන ලද උපදෙස්වලට සමගාමීව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ අංක SEC/2020/02 හා 2020.02.18 දිනැති චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සේවායෝජකයින් විසින් පහත සඳහන් සේවාන්ත ප්‍රතිලාභ නිදහස් කිරීමට පෙර ඉහත කී චක්‍රලේඛයේ විශේෂයෙන් සඳහන් කර ඇති එකී ප්‍රතිලාභ රඳවා ගත යුතුය;

1. පහත ගෙවීම්වල මුළු ප්‍රමාණය රු.5,000,000/= ඉක්මවයි නම් අතිරේක ප්‍රමාණය මත 12% ක් රඳවා ගත යුතු වේ;

   අ. විශ්‍රාම වැටුපක් පරිවර්තිත කිරීමේදී ගෙවිය යුතු මුදල් ප්‍රමාණය

   ආ. විශ්‍රාම පාරිතෝෂිකයක් වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය

   ඇ. සියලු සේවානියුක්තිකයින්ට එක සමානව අදාළ වන බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන ක්‍රමයක් යටතේ, ධුරය හෝ සේවානියුක්තිය අහිමිවීම සම්බන්ධයෙන් වන්දි මුදලක් ලෙස ගෙවිය යුතු මුදල් ප්‍රමාණය

   ඈ. සේවානියුක්තික භාර අරමුදලෙන් (සේ.නි.භා.අ.) ගෙවිය යුතු ඕනෑම මුදලක් (1987.03.31 වන දිනෙන් පසු ඉපයූ අරමුදලේ ආයෝජන ආදායම් කොටස හැර)

2. සේවායෝජකයින් විසින් පහත ඕනෑම ගෙවීමක් හෝ ප්‍රතිලාභයක් මත 18% ක් රඳවා ගත යුතුවේ;

   අ. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත නොකළ යෝජනා ක්‍රමයක් යටතේ ධුරය හෝ සේවානියුක්තිය අහිමිවීම සම්බන්ධයෙන් ගෙවන වන්දි මුදල

   ආ. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත නොකළ නියාමනය කළ අර්ථසාධක අරමුදකින් හැර වෙනත් ගෙවීම්

   ඇ. වෙනත් යම් ගෙවීමක්

   ඈ. මූල්‍යමය නොවන විශ්‍රාම ප්‍රතිලාභ (වෙළඳ පොළ මිලට අගය නියම කෙරෙන)

ඒ අනුව සේවානියුක්තිකයකු ලෙස, බදු මුදල් රඳවාගත් දින සිට දින 90ක් ඇතුළත අදාළ විධානය ලබා ගැනීම සඳහා 1 වන වගුවේ දක්වා ඇති අතිරේක ලිපිලේඛන සමග "**සේවාන්ත ප්‍රතිලාභ නිදහස් කිරීම සඳහා වන අයදුම් පත** " ඔබ විසින් භාරදීම අවශ්‍ය වේ.

https://www.ird.gov.lk www.facebook.com/irdcolsl/

**1 වන වගුව : සේවාන්ත ප්‍රතිලාභ නිදහස් කිරීම උදෙසා භාරදිය යුතු අතිරේක ලිපිලේඛන**

| සේවාන්ත ප්‍රතිලාභ | රඳවාගත යුතු ප්‍රතිශතය | අවශ්‍ය ලිපිලේඛන |
|---|---|---|
| පාරිතෝෂික<br>* * * | 12% | 1. ජාතික හැඳුනුම්පතේ පිටපත/විදේශ ගමන් බලපත්‍රයේ පිටපත<br>2. සේවායෝජකයා විසින් පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කළ ලිපිය (පාරිතෝෂිකයේ ප්‍රමාණය, එය එක හා සමානව අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රදානය කළේද යන වග, රඳවාගත් ප්‍රමාණය, පාරිතෝෂිකය ගණනය කිරීමේ පදනම හෝ ආකාරය එනම් මූලික වැටුප හෝ දළ වැටුප පදනම් කරගෙන ද යන වග, සේවා කාලය ඇතුළුව)<br>3. සේවා නියුක්තික භාර අරමුදලේ දායකත්වය<br>4. T-10 සහතික තුන (3) ක් (වර්තමාන තක්සේරු වර්ෂය සඳහා වන T-10 ඇතුළුව) |
| පරිවර්තිත විශ්‍රාම වැටුප<br>* * * | 12% | 1. ජාතික හැඳුනුම්පතේ පිටපත/විදේශ ගමන් බලපත්‍රයේ පිටපත<br>2. සේවායෝජකයා විසින් පරිවර්තිත විශ්‍රාම වැටුප ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කළ ලිපිය (විශ්‍රාම වැටුපේ පරිවර්තිත ප්‍රමාණය, එය එක හා සමානව අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රදානය කළේද යන වග, රඳවාගන්නා ප්‍රමාණය, සේවා කාලය ඇතුළුව)<br>3. සේවා නියුක්තික භාර අරමුදලේ දායකත්වය<br>4. T-10 සහතික තුන (3) ක් (වර්තමාන තක්සේරු වර්ෂය සඳහා වන T-10 ඇතුළුව) |
| සේවා නියුක්තික භාර අරමුදල<br>* * * | 12% | 1. ජාතික හැඳුනුම්පතේ පිටපත/විදේශ ගමන් බලපත්‍රයේ පිටපත.<br>2. සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලය විසින් නිකුත් කළ ලිපිලේඛන (සේවා නියුක්ති භාර අරමුදලේ ලිපි ශීර්ෂයෙන්)<br>3. සේවා කාලය අවුරුදු 5 කට වැඩි නම්, පාරිතෝෂික යටතේ ලැයිස්තුගත කළ 2 අයිතමය අනුව පාරිතෝෂික ගෙවූයේ නම්, සේවායෝජකයා විසින් පාරිතෝෂික ගෙවීම්වල විස්තර සඳහන් කළ ලිපිය<br>4. T-10 සහතික තුන (3) ක් (වර්තමාන තක්සේරු වර්ෂය සඳහා වන T-10 ඇතුළුව) |
| වන්දි | 18% | 1. ජාතික හැඳුනුම්පතේ පිටපත/විදේශ ගමන් බලපත්‍රයේ පිටපත.<br>2. සේවායෝජකයා විසින් වන්දි ගෙවීම් සම්බන්ධයෙන් නිකුත් කළ ලිපිය (වන්දි ප්‍රමාණය, රඳවාගත් ප්‍රමාණය, සේවා කාලය ඇතුළුව)<br>3. බදු නිදහස් කිරීමක් ප්‍රදානය කළේ නම් ඒ සඳහා දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ප්‍රදානය කළ ලිපිය<br>4. T-10 සහතික තුන (3) ක් (වර්තමාන තක්සේරු වර්ෂය සඳහා වන T-10 ඇතුළුව)<br>5. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ප්‍රදානය කර තිබේ නම් පාරිතෝෂික යටතේ ලැයිස්තුගත කළ 2 සහ 3 වන අයිතමයන් |
| Ex-Gratia<br>* * * | 18% | 1. ජාතික හැඳුනුම්පතේ පිටපත/විදේශ ගමන් බලපත්‍රයේ පිටපත.<br>2. සේවායෝජකයා විසින් නිකුත් කළ Ex-Gratia ගෙවීම් පිළිබඳ ලිපිය (Ex-Gratia ප්‍රමාණය, රඳවාගත් ප්‍රමාණය, සේවා කාලය ඇතුළුව)<br>3. T-10 සහතික තුන (3) ක් (වර්තමාන තක්සේරු වර්ෂය සඳහා වන T-10 ඇතුළුව) |

* * *  සේවා වාර්තා/දිවුරුම් ප්‍රකාශ [ඔබට පෙර ස්ථානයන්හි යම් සේවාවක් තිබුණි නම් කරුණාකර සේවා වාර්තා/දිවුරුම් ප්‍රකාශ සපයන්න.(සේවයට බැඳුනු දිනය, සේවයෙන් ඉවත් වූ දිනය, පාරිතෝෂිකයේ සහ සේවා නියුක්ති භාර අරමුදලේ දළ ප්‍රමාණ ඇතුළුව)]

**එවැනි අයදුම්පත් පහත ලිපිනයට භාරදිය යුතුය;**

කොමසාරිස්
උපයනවිට ගෙවීම් විගණන අංශය
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
100, වැකන්ද පාර
නවම් මාවත
කොළඹ 02.

**වැඩිදුර තොරතුරු සඳහා පහත සඳහන් නිලධාරීන් අමතන්න;**

| තනතුර | දුරකථන අංකය |
|---|---|
| කොමසාරිස් | 011 230 2246 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | 011 230 2859 |
| නියෝජ්‍ය/සහකාර කොමසාරිස් | 011 230 2964, 011 230 0115, 011 230 2874, 011 230 2863, 011 230 2951, 011 230 2862, 011 230 2958 |

www.ird.gov.lk
www.facebook.com/irdcolsl/